ප්‍රධාන ලේකම් කාර්යාලය - උතුරු මැද පළාත - අනුරාධපුර
பிரதான செயலாளர் அலுவலகம் - வடமத்திய மாகாணம் - அனுராதபுரம்
OFFICE OF THE CHIEF SECRETARY - NORTH CENTRAL PROVINCE - ANURADHAPURA

උතුරු මැද පළාත් සභා සංකීර්ණය, 4 වන මහල B, හරිශ්චන්ද්‍ර මාවත, අනුරාධපුරය.
வட மத்திய மாகாண சபை கட்டிடத் தொகுதி. 4ம்மாடி "ஆ" ஹரிச் சந்திரா வீதி. மாவத்த. அனுராதபுரம்.
North Central Provincial Council Complex 4th Floor B, Harischandra Mawatha, Anuradhapura.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary

දුරකථනය / தொ.பே.இல / Tele: 025-2222695
විමසීම් / விசாரணை / Inquiries: 025-2235790
Fax: 025-2224614
E-mail: csncpc@gmail.com


මගේ අංකය / எனது இல. / My No.: NCP/CS/ED/5/7/3

ඔබේ අංකය / உமது இல. / Your No.:

දිනය / திகதி / Date: 2022/08/04

**ආයතන චක්‍රලේඛ 2022/01(III)**

සියළුම ලේකම්වරුන් හා නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන් ,
ප්‍රධාන අභ්‍යන්තර විගණක,
පළාත් ආදායම් කොමසාරිස් ,

**<u>පවතින සම්පත් හිඟය මත රාජ්‍ය වියදම් අවම කර ගැනීම සඳහා රාජ්‍ය ආයතනවල කාර්ය මණ්ඩල කැඳවීම සීමා කිරීම.</u>**

උක්ත කරුණට අදාළව මාගේ සමාංක හා 2022/05/31 දිනැතිව නිකුත් කර ඇති අංක 2022/01 ආයතන චක්‍රලේඛයට වැඩිමනත් වශයෙනි.

02. ඒ අනුව උක්ත මාගේ චක්‍රලේඛය මඟින් සතියේ දින 03ක් සේවය කිරිමට අවස්ථාව ලබා දෙන ලද අතර සෙනසුරාදා දින කාර්යාලය විවෘත කිරිමට ඉල්ලීම් තිබේනම් එවැනි ඉල්ලීම් මා වෙතින් කල් තබා අනුමැතිය ලබා ගන්නා ලෙස දන්වා සිටින ලද අතර , එසේ දින තුනක් සේවයේ යෙදී සෙනසුරාදා දින කාර්යාලය විවෘත කොට අතිකාල ලබා ගැනීම පාලනයකින් තොරව සිදු විය හැකි බව නිරීක්ෂණය වූ හෙයින් හා එසේ දින 03 ක් රාජකාරි සිදු කොට අතිකාල ලබා ගැනිම නොගැලපෙන ක්‍රියාවක් ලෙස හැඟී යාමක් සිදු වූ බැවින් සෙනසුරාදා දින කාර්යාලය විවෘත කිරිම අනුමත නොකරන ලදී

03. නමුත් රාජ්‍ය පරිපාලන , ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/2022(I) ට සමගාමීව මාගේ සමාංක හා 2022.08.04 දිනැතිව නිකුත් කරන ලද ආයතන චක්‍රලේඛ 2022/01(I) මඟින් සිකුරාදා දිනය කාර්යාලය වසා තැබීමට ගත් තීරණය අවලංගු කර ඇති බැවින් , සතියේ රාජකාරි දින 05හි ඉටු කල නොහැකි රාජකාරි පවතීනම් සේවයේ අවශ්‍යතාවය මත අමාත්‍යාංශ ලේකම්වරයාගේ / ආයතන ප්‍රධානියාගේ අනුමැතිය මත සෙනසුරාදා දින කාර්යාලය විවෘත කිරිමට අනුමැතිය ලබා දෙනු ලබන අතර , ඒ සඳහා අතිකාල ලබා ගැනිමට යම් අයෙකු අදහස් කරන්නේ නම් ; ඒ සඳහා සතියේ රාජකාරි කරන දින 05 තුළම රාජකාරියේ නිරතවීම පූර්ව අවශ්‍යතාවයක් බව දන්වමි. (පෞද්ගලික නිවාඩු දින හැර)

04. එසේම මාගේ සමාංක හා 2022/05/31 දිනැතිව නිකුත් කරන ලද ආයතන චක්‍රලේඛ 2014/01(IV) හි 10 වගන්තියෙහි සතියේ දිනවල අතිකාල සේවයේ යෙදිය හැකි උපරිම පැය 03 ලෙස සංශෝධනය කරන ලද කාල සීමාව පැය 02 ලෙස සංශෝධනය කරනු ලබන අතර , සති අන්ත සෙනසුරාදා දින පැය 09 ක උපරිම පැය සීමාවට යටත්ව අතිකාල සේවයේ යෙදී සිටිමට අවසර ලබා දෙමි.

05. කෙසේ වුවද මෙම අතිකාල වෙනුවෙන් දැරිමට සිදුවන වියදම් වෙනුවෙන් අතිරේක ප්‍රතිපාදනයන් සැලසීමට හැකියාවක් නොමැති බවද , පවත්නා ප්‍රතිපාදන සීමාව තුළ පිහිටා අදාළ වියදම් කළමනාකරණය කර ගන්නා මෙන් වැඩිදුරටත් දන්වා සිටිමි.

එල්.ජේ.එම්.ජී.චන්ද්‍රසිරි බණ්ඩාර
ප්‍රධාන ලේකම් ,
උතුරු මැද පළාත.